Good Food, Good Life

Nestlé Lanka PLC News Release

Colombo: 23 March 2016

# නෙස්ලේ කූල්ප්‍රෝ (NESTLÉ COOLPRO)- ශ්‍රී ලංකාවේ ප්‍රථම ස්මාර්ට් ශීත කළ පානීය නිපැයුම් මිශ්‍රණ යන්ත්‍රය (smart Cool Beverage Solution), පහසුවෙන් නැවුම් බවක් ලබාගන්න

නෙස්ලේ ප්‍රොෆෙෂනල් යනු නෙස්ලේ සමාගමේ 'Out-of-Home' ආහාර සහ පානීය නිෂ්පාදන අංශයයි. නවීන ස්මාර්ට් තාක්ෂණයෙන් සවිබලගැන්වුන ශීත කළ පානීය නිපැයුම් මිශ්‍රණ යන්ත්‍රයක් (cool beverage dispenser) ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට නෙස්ලේ කූල්ප්‍රෝ නමින් හඳුන්වා දෙන්නට නෙස්ලේ ප්‍රොෆෙෂනල් කටයුතු කරන ලදි. මෙය සැබැවින්ම විප්ලවීය හඳුන්වාදීමක් වන අතර අවන්හල්, හෝටල් සහ ආහාර අලෙවි ජාලයන් සඳහා මැනවින් ගැලපෙන ශීත කළ බීම වර්ග ඉක්මනින් සහ සරලව සාදාගත හැකි පහසු විසඳුමක් වනු ඇත.

පාරිභෝගිකයින් යනු වඩාත් අවධානයෙන් පසුවන පිරිසක් වන අතර ඔවුන්ට අවශ්‍ය සුවිශේෂ රසයකින් යුත් නිපැයුම් පමණක් නොව, විශිෂ්ට ගුණාත්මකභාවයක් අපේක්ෂා කරන අතර නව්‍ය අත්දැකීමක් විඳගැනීමේ කැමැත්තෙන්ද පසුවෙති. පුළුල් පරාසයක පැතිරුණු තම පාරිභෝගිකයින්ගේ විවිධාකාර අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමේ අභියෝගාත්මක වටපිටාවක් Out-of-Home ව්‍යාපාරයන් වෙත මේ වන විට ඇතිවෙමින් පවතී.

නෙස්ලේ කූල් ප්‍රෝ නිපදවා ඇත්තේ Out-of-Home ව්‍යාපාරයන්හි සෑම පානීය නිපැයුම් අවශ්‍යතාවයක්ම සම්පූර්ණකරගත හැකි පරිදිය. එම යන්ත්‍රය මගින් ආරම්භක වශයෙන් නව්‍ය රසවත් පානයක්වන '*Nestlé Sjora*' නිපදවීමට හැකියාව ලබාදී තිබෙන අතර එය අඹ, පීච් සහ කිරි රස සංයෝගයකින් සමන්විත ශීත කළ රසවත් පානයක් වේ. *Nestlé Sjora* වෙනත් පානයන්ගෙන් වෙන්කරන විශිෂ්ට, ප්‍රිය උපදවන, සැහැල්ලු මෙන්ම නැවුම්බවක් ලබාදෙන රසයකින් යුක්තය.

''ඕනෑම Out-of-Home ව්‍යාපාරයක් සාර්ථක කරගැනීමට හැකි ක්‍රමවේදයක් අපි නිර්මාණය කර තිබෙනවා. මෙම යන්ත්‍රය මගින් ප්‍රමිතිය ස්ථාවරව පවත්වා ගනිමින් ද්‍රව සාන්ද්‍රණයක් භාවිතා කරන නිසා මිශ්‍ර කිරීමේ අවශ්‍යතාවයක් මතුවන්නේ නෑ. මෙය නිසා සේවක ශ්‍රමය මෙන්ම කාලය ඉතිරිවනවා පමණක් නෙවෙයි එය භාවිතා කිරීම ඉතාමත් පහසුයි. සනීපාරක්ෂාව අතින් ඉතාම ඉහළ වන නෙස්ලේ කූල්ප්‍රෝ අඩු ඉඩකඩක පවා පහසුවෙන් තැබිය හැකියි. සරල ලෙස බොත්තමක් ටච් කිරීමෙන් මෙම යන්ත්‍රය ක්‍රියාත්මක වන අතර Out-of-Home ව්‍යාපාර අංශයෙහි වෙනසක් සිදුකිරීමට මෙන්ම ශ්‍රී ලංකාවේ ශීත කළ පානීය නිපැයුම් කර්මාන්ත ක්ෂේත්‍රයට විප්ලවීය අත්දැකීමක් ලබා දීමටද හැකියාව ලැබෙන බව අපට විශ්වාසයි.'' යනුවෙන් මෙම නව්‍ය හඳුන්වා දීම පිළිබඳව අදහස් දැක්වූ නියෝජ්‍ය උප සභාපති, නෙස්ලේ ප්‍රොෆෙෂනල් - රොෂාන් පෙරේරා මහතා පැවසීය.

Sponge පේස්ට්‍රි අලෙවි සැලේ හිමිකරු අකන්ත පණ්ඩිතසේකර, නෙස්ලේ කූල්ප්‍රෝ යන්ත්‍රය පිළිබඳව අදහස් දක්වමින් ''මගේ පේස්ට්‍රි අලෙවි සැලේ තිබෙන පානීය නිපැයුම් මිශ්‍රණ යන්ත්‍ර සේවකයින් අතින් ක්‍රියාත්මක කෙරෙන ඒවායි. එය ක්‍රියාත්මක කර තිබෙන තුරු මගේ කාර්යමණ්ඩලයට එතැනින් ඉවත්වීමට අපහසුයි. නෙස්ලේ කූල්ප්‍රෝ ස්වයංක්‍රීය පානීය නිපැයුම් මිශ්‍රණ යන්ත්‍රය නිසා මගේ කාර්යමණ්ඩලයට ඔවුන්ගේ කාලය වඩාත්ඵලදායී ලෙස යොදාගැනීමේ හැකියාව ලැබෙනවා. මෙම යන්ත්‍රයෙහි ඇති කොටස් පාලන පහසුකම (portion control feature) නිසා අපතේ යාම් ගැන අපට කිසිදු ගැටළුවක් මතුවන්නේ නෑ. ටච් තිරය මත දිස්වන 'served cup' තොරතුරු පහසුකම නිසා තොග මට්ටම් කළමනාකරණයට වගේම වියදම් අවම කරගැනීමටත් මේ මගින් හැකියාව ලැබෙනවා. සෑම කෝප්පයකම උපරිම ප්‍රමිතිය පිළිබඳ වගකිව හැකිවීම නිසා නෙස්ලේ කූල්ප්‍රෝ යන්ත්‍රයට මා වඩාත් ඇළුම් කරනවා.'' යනුවෙන් පැවසීය.

Out-of-Home ව්‍යාපාරයන්හි අවශ්‍යතාවයන්ට මැනවින් ගැලපෙන ලෙස නිර්මාණය කර ඇති නෙස්ලේ කූල්ප්‍රෝ යන්ත්‍රය දිවයින පුරා අලෙවි ප්‍රදර්ශනාගාරයන් වෙත යොමු කරවීමට කටයුතු යොදා තිබේ.